1st Place Winner
National Productivity
Award 2020

ISO 9001
SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/05/08/2023(22) | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2023.05. 08 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
**දකුණු පළාත.**

**<u>නිවාඩු දින වැටුප් අනුමත කිරීමට සහ රජයේ නිවාඩු දිනයන්හි කාර්යාලය විවෘත කිරීමට අනුමැතිය ලබාදීම සඳහා බලය පැවරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව 2023.04.20 දින පැවති පළාත් ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සාකච්ඡාවේ දී ගනු ලැබූ තීරණ හා බැඳේ.

02. ඒ අනුව, මා විසින් නිකුත් කර ඇති අංක CSS/03/05/03/2023(07) හා 2023.02.07 දිනැති ලිපියෙහි 03 වන ඡේදයේ නිවාඩු දින වැටුප් අනුමත කිරීමට අදාළ විධිවිධාන පමණක් ද අතිකාල හා අනෙකුත් දීමනා ගෙවීම් සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති අංක CSS/03/05/01/08 හා 2015.12.31 දිනැති ලිපියෙහි 09 වැනි ඡේදය සහ මාගේ අංක CSS/03/05/03/2023(01) හා 2023.01.13 දිනැති ලිපියෙහි 03 වැනි ඡේදයේ සඳහන් සති අන්ත හා අනෙකුත් රජයේ නිවාඩු දින කාර්යාලය විවෘත කිරීමට අදාළ විධිවිධාන පමණක් ද පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

03. 2023 මැයි මස සිට 2023 අයවැය ඇස්තමේන්තුව මඟින් වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව, අවස්ථානුකූල ව පැනවිය හැකි ප්‍රතිපාදන සීමා කිරීම් වලට හා බලය පවරනු ලබන නිලධාරියාගේ පූර්ණ වගකීම් භාරය දැරීමට යටත්ව එක් එක් අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතනවල සේවයේ නියුතු නිලධාරීන්ගේ නිවාඩු දින වැටුප් අයදුම්පත් අනුමත කිරීමට සහ එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා රජයේ නිවාඩු දිනයන්හි කාර්යාලය විවෘත කිරීමට අනුමැතිය ලබාදීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ ලේකම් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත බලය පවරනු ලැබේ.

04. ඒ අනුව, ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ දින වැටුප් අයදුම්පත් පමණක් අනුමැතිය සඳහා මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

05. තව ද, කාර්යාලය විවෘත කරනු ලබන රජයේ නිවාඩු දිනයන්හි අනිවාර්යයෙන් මාණ්ඩලික නිලධාරියෙකු පූර්ණ කාලීනව කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර, මෙසේ කාර්යාලය විවෘත කරනු ලැබිය යුත්තේ ප්‍රමුඛත්වය දිය යුතු අත්‍යාවශ්‍ය හා හදිසි විශේෂ රාජකාරියක දී පමණක් විය යුතු බව අවධාරණය කරමි.

06. මෙම බලය පැවරීම වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා හෝ විටින් විට පැනවිය හැකි ප්‍රතිපාදන සීමා අභිබවා වියදම් දැරීමේ බලය දීමක් ලෙස කිසිසේත් නොසැලකිය යුතු අතර වර්ෂය තුල ඉටු කිරීමට නියමිත කාර්යයන් මනා කළමනාකරණයකින් යුතුව හා සංවිධානාත්මකව ඉටු කර ගැනීමට අදාළ අමාත්‍යාංශ ලේකම් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත පැවරෙන වගකීමක් ලෙස සැලකිය යුතුය.

07. එසේම මෙම විධිවිධාන පරිදි ක්‍රියා කිරීමෙන් වර්ෂය තුල යහපත් මූල්‍ය විනයක් පවත්වාගෙන යාමටත් අඛණ්ඩ හා ප්‍රශස්ත සේවයක් සැලසීමටත් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මේ සම්බන්ධයෙන් ඔබට අයත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත